## <u>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත</u>

# උතුරු මැද පළාතේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2021(සිංහල / දෙමළ /ද්විභාෂා )

උතුරු මැද පළාතේ පාසල් වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට හා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (ඇ) ශ්‍රේණියට අධ්‍යාපන කලාප මට්ටමින් බඳවා ගැනීම පිණිස පහත සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය 2021.08.31 දින වේ.

**01.** **යෝග්‍යතාවය**

**1.1** **සාමාන්‍ය සුදුසුකම්**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

Ii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

iii. 2021.08.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

iv. 2021.08.31 දිනට හෝ ඊට පෙර උපාධිය/ ඩිප්ලෝමා පාඨමාලාව හා සියලු අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

v. 2021.08.31 දින වන විට උතුරු මැද පළාතේ පූර්වාසන්න අවුරුදු 03 කට නොඅඩු ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. <u>**විද්‍යාව, විශේෂ අධ්‍යාපනය, ගණිතය, දෙවන බස (දෙමළ), කෘෂි හා ආහාර තාක්ෂණය, චිත්‍ර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ගෘහ ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව (උසස් පෙළ) විෂයයන්**</u> සඳහා සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් උතුරු මැද පළාත තුළින් තෝරා ගැනීමට නොහැකි වුවහොත් පමණක්, උතුරු මැද පළාතේ අවම වශයෙන් වසර 10ක් සේවය කිරීමට යටත්ව දීපව්‍යාප්ත මට්ටමින් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් සළකා බලනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය ඡන්ද හිමි නාම ලේඛන හෝ ග්‍රාම නිළධාරී සහතික මගින් සනාථ කළ යුතුය.

**1.2** **අධ්‍යාපන සුදුසුකම්**

| සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය | | |
|---|---|---|
| ශ්‍රේණි පරාසය | විෂයය | බඳවා ගැනීමේදී තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් |
| 1-5 ප්‍රාථමික | ප්‍රාථමික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් සිංහල භාෂාව/දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂ /සාමාන්‍ය උපාධියක් ලබා ලබා ඇති කලා උපාධිධාරියකු වීම හෝ කලා විෂය ධාරාව යටතේ සාමාන්‍ය/ විශේෂ උපාධියක් සමග උසස්පෙළ විභාගයේ දී සිංහල විෂය / දෙමළ විෂය හදාරා තිබීම. |
| 6-11 ශ්‍රේණි | විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමන විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී / විද්‍යාවේදී (කෘෂිකර්ම) ප්‍රථම උපාධිය ලබා තිබීම හා අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත විෂයයන් 03 එක්වරකදී සමත් වී තිබිය යුතුය.<br>1. භෞතික විද්‍යාව<br>2. රසායන විද්‍යාව<br>3. ජීව විද්‍යාව/උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව යන විෂයයන් වලින් එක් විෂයයක් |

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | ගණිතය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී (භෞතිය විද්‍යාව) උපාධියක් ලබා තිබීම<br>හෝ<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මඟින් පිරිනමන විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම<br>හා<br>අ.පො.ස.(උ/පෙළ)සඳහා සංයුක්ත ගණිතය විෂයයක් ලෙස හදාරා ඉන් සමත් වී තිබීම. |
| | මව්බස (සිංහල/දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සිංහල භාෂාව/දෙමළ භාෂාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සිංහල භාෂාව/දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම |
| | ඉංග්‍රීසි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂවේදී උපාධියක් හෝ ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම<br>හෝ<br>ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් පිරිනමන ලද ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි) දෙවසරක පූර්ණ කාලීන පාඨමාලාව සහ හය මසක පාසල් පාදක ගුරු පුහුණුව සම්පූර්ණ කර තිබීම සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. |
| | ඉතිහාසය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ඉතිහාසය පිළිබඳව විශේෂ උපාධියක් හෝ ඉතිහාසය ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | හින්දු ධර්මය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක හින්දු ධර්මය/හින්දු ශිෂ්ටාචාරය ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | රෝමානු කතෝලික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක රෝමානු කතෝලික ධර්මය ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | භූගෝල විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් හෝ භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් හෝ සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ව්‍යාපාර අධ්‍යයනය /ව්‍යාපාර පරිපාලනය/ගිණුම්කරණය/ ප්‍රධාන විෂයක් ලෙස හදාරා විද්‍යාවේදී හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | දෙවන භාෂාව (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක දෙමළ භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම.(1.6 ඡේදය බලන්න) |
| | දෙවන භාෂාව (සිංහල) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සිංහල භාෂාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක් ලබා තිබීම. (1.6 ඡේදය බලන්න) |

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | සංගීතය (පෙරදිග) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමන ප්‍රාසාංගික කලා උපාධි (සංගීතය) ලබා තිබීම. ප්‍රාසාංගික කලාවේදී/ලලිත කලාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා ඇත්නම් සංගීතය විෂයය, උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය සම්මාන සංඛ්‍යාවෙන් 1/3 ක් සංගීතය විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | සංගීතය (අපරදිග) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමන ප්‍රාසාංගික කලා (සංගීතය) පිළිබඳ උපාධියක් ලබා තිබීම. පියානෝ (Piano) විෂයය, උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | සංගීතය (කර්ණාටක) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සංගීතය (කර්ණාටක) පිළිබඳව විශේෂ උපාධියක් හෝ සංගීතය (කර්ණාටක) ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | චිත්‍ර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමන ප්‍රාසාංගික කලා උපාධි (චිත්‍ර) ලබා තිබීම. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා ඇත්නම් චිත්‍ර විෂයය, උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය සම්මාන සංඛ්‍යාවෙන් 1/3 ක් චිත්‍ර විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | නැටුම් (දේශීය) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නැටුම් (දේශීය) විශේෂ උපාධියක් හෝ නැටුම් (දේශීය) ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | නැටුම් (භාරතීය) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පිරිනමන භරත නාට්‍යම් පිළිබඳ උපාධියක් හදාරා තිබීම.(ප්‍රායෝගික කොටස් සහිතව) ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | නාට්‍ය හා රංග කලාව (සිංහල) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නාට්‍ය හා රංග කලාව (සිංහල) පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නාට්‍ය හා රංග කලාව (දෙමළ) පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. ප්‍රායෝගික පරීක්ෂණයේදී විෂය ඉගැන්වීම පිළිබඳ දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. |
| | කෘෂි හා ආහාර තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂි හා ආහාර තාක්ෂණය/කෘෂි කර්මය/කෘෂි විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික තාක්ෂණය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිව් අවුරුදු පාඨමාලාව (යාන්ත්‍රික) (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (NDEC) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උසස් ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (යාන්ත්‍රික) (HNDE) ලබා තිබීම. |
| | නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණකරණය හා තාක්ෂණවේදය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිව් අවුරුදු පාඨමාලාව-(ඉලෙක්ට්‍රෝනික්) (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (NDEC) හෝ ඉලෙක්ට්‍රෝනික් පිළිබඳව උසස් ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (ඉලෙක්ට්‍රෝනික්) (HNDE) ලබා තිබීම. |
| | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණකරණය හා ඉදි කිරීම් තාක්ෂණය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිව් අවුරුදු පාඨමාලාව (ඉදි කිරීම් ) (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (ඉදි කිරීම් ) (NDEC) හෝ ඉදිකිරීම් පිළිබඳව උසස් ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (සිවිල් ) (HNDE) ලබා තිබීම. |
| | ශිල්ප කලා | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ශිල්ප කලා ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ගෘහ ආර්ථික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ගෘහ ආර්ථික විද්‍යාව/ආහාර තාක්ෂණය හෝ ආහාර පෝෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ඕනෑම උපාධියක් ලබා තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ඊට සමාන පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් එක් වසරකට නොඅඩු සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. |

| | | |
|---|---|---|
| උසස් පෙළ | ජීව විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව/ජීව විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව/ජීව විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br>අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත විෂයයන් 03 එක්වරකදී සමත් වී තිබිය යුතුය.<br>1. භෞතික විද්‍යාව<br>2. රසායන විද්‍යාව<br>3. ජීව විද්‍යාව/උද්භිද විද්‍යාව/සත්ත්ව විද්‍යාව යන විෂයයන් වලින් එක් විෂයයක් |
| | කෘෂි විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂි විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් හෝ කෘෂි විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත විෂයයන් 03 එක්වරකදී සමත් වී තිබිය යුතුය.<br>1. භෞතික විද්‍යාව<br>2. රසායන විද්‍යාව<br>3. කෘෂි විද්‍යාව |
| | ඉංජිනේරු තාක්ෂණවේදය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව සිවිල්/විදුලි/ඉලෙක්ට්‍රෝණික/ යාන්ත්‍රික) විෂයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිව් අවුරුදු පාඨමාලාව (ඉදි කිරීම්) (NDT) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (ඉදි කිරීම් ) (NDEC) හෝ ඉදිකිරීම් පිළිබඳව උසස් ජාතික සිව් අවුරුදු ඩිප්ලෝමාවක් (සිවිල්) (HNDE) ලබා තිබීම. |
| | ජෛව පද්ධති තාක්ෂණවේදය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂි විද්‍යාව විෂයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය/භෞතික විද්‍යාව/රසායන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ආර්ථික විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් හෝ ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | දේශපාලන විද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක දේශපාලන විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් හෝ දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳව විශේෂවේදී උපාධියක් සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | ශිෂ්‍ය උපදේශනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් මනෝවිද්‍යාව/උපදේශනය ප්‍රධාන විෂයය සහිතව උපාධියක් ලබා තිබීම හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් උපාධියක් ලබා තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| | විශේෂ අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ඕනෑම උපාධියක් ලබා තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක විශේෂ අධ්‍යාපනය පිළිබඳව එක් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම. |

ද්වි භාෂා මාධ්‍යය

| විෂයය | | බඳවා ගැනීමේදී තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම |
|---|---|---|
| 6-11 ශ්‍රේණි | භූගෝලවිද්‍යාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක භූගෝල විද්‍යාව පිළිබඳව ඉංග්‍රීසි මාධ්‍ය විශේෂ උපාධියක් හෝ භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි මාධ්‍ය යෙන් හදාරා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් හෝ සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව/භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා සාමාන්‍ය උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා තිබීම. |
| | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ඉංග්‍රීසි මාධ්‍ය විශේෂවේදී උපාධියක් හෝ සාමාන්‍ය උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම ඉංග්‍රීසි මාධ්‍ය උපාධියක් ලබා තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ඊට සමාන පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් එක් වසරකට නොඅඩු සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. |

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන (වෘත්තීය විෂය ධාරාව) - සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍යය

| **විෂයය** | බඳවා ගැනීමේදී තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම |
|---|---|
| සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී උපාධිය හෝ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයක් ලෙසට හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ප්‍රාසංගික කලාව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ප්‍රාසංගික කලා පිළිබඳ විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රාසංගික කලා උපාධිය හෝ නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ප්‍රසංගික කලාව ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| කාර්ය සිද්ධි කළමණාකරනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමණාකරන උපාධිය හෝ කාර්ය සිද්ධි කළමණාකරනය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ශිල්ප කලා | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර කලා) හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ දෘශ්‍ය හා තාක්ෂණික කලා උපාධිය හෝ ලලිත කලාවේදී උපාධිය හෝ ශිල්ප කලා ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| අභ්‍යන්තර නිර්මාණකරණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණවේදී උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| විලාසිතා නිර්මාණකරණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා) හෝ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය හෝ විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |

| | |
|---|---|
| ග්‍රැෆික් නිර්මාණකරණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර හා ග්‍රැෆික්) හෝ පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඇතුළත් උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| භූ දර්ශන නිර්මාණකරණය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශන පිළිබඳ ප්‍රථම උපාධිය හෝ භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑර උපාධියක් ලබා තිබීම |
| ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (සත්ත්ව විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සත්ත්ව පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ආහාර විද්‍යාව හා තාක්ෂණ විශේෂීකරණය සහිතව) හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ ආහාර නිෂ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම |
| ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ජලජීවී විද්‍යාව පිළිබඳ විශේෂීකරණය සහිතව) හෝ ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයක් ලෙස ජලජ සම්පත් කළමනාකරණය විෂයය ඇතුලත් ප්‍රථම උපාධිය හෝ ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ අපනයන කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදි උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක තාක්ෂණවේදි උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| පේෂ කර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |

| | |
|---|---|
| ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ තාක්ෂණවේදී උපාධිය සිවිල් (ඉදිකිරීම්) හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| මෘදුකාංග සංවර්ධනය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හෝ පරිගණක විද්‍යාව ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ මෘදුකාංග සංවර්ධනය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |
| සංචරණය හා ආගන්තුක සත්කාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක ආගන්තුක සත්කාර හා විවේක කළමණාකරනය පිලිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාව සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් ලබා තිබීම |

**1.3** **අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපාධි පිරිනමා ඇති ආයතන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන විය යුතුය.**

**1.4** **ඉල්ලුම් කරනු ලබන විෂයය සඳහා පළමු සුදුසුකම වශයෙන් ඉල්ලුම් කරන විෂයය සහිතව සාමාන්‍යවේදී උපාධියක් ලබා ඇත්නම් එම විෂයය, උපාධියෙහි එක් ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබිය යුතු අතර එම උපාධි පාඨමාලාවේ විෂය සම්මාන(Credit) සංඛ්‍යාවෙන් 1/3 ක් ඉල්ලුම් කරන විෂයට අදාළව සම්පූර්ණ කර තිබිය යුතුය.**

**1.5** **ඉහත සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් උපාධිය හෝ ඩිප්ලෝමාව සමත් වන දිනට කළින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව, අවම වශයෙන් සම්මාන 03ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම සහ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එක්වරකදී විෂයයන් 3 කින් සමත්ව තිබිය යුතුය.**

**1.6** **දෙවන භාෂාවක් සඳහා පුරප්පාඩු පවතින පාසලේ භාෂා මාධ්‍යයට අදාළව අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී සාමාර්ථයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වනු ඇත.**

**1.7** **ඉහත සඳහන් සියලු සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.**

## 2. බඳවා ගැනීමේ ක්‍රමය හා සේවා කොන්දේසි

අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් හෝ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතුය. අයදුම්පත් කැඳවන ලද විෂයයන් සඳහා අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණුවල මුළු එකතුව සහ 4.3 ඡේදය අනුව ලබා දී ඇති කලාප ප්‍රමුඛතාවය සලකා අධ්‍යාපන කලාප මට්ටමින් කුසලතා අනුපිළිවෙළ අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. එයින් සමත් වූවන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරවීමෙන් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. යම් අයදුම්කරුවෙක් කුලසතා අනුපිළිවෙලේ ලබා ඇති ස්ථානය ඉල්ලුම්කර ඇති අධ්‍යාපන කලාප (4.3 ඡේදය අනුව) වල පවතින පුරප්පාඩු සඳහා තෝරා ගැනිමට ප්‍රමාණවත් නොවන විට උතුරු මැද පළාත තුල ඕනෑම කලාපයක සේවය කිරීමට එකග විය යුතුය.

2.1 13 වසරක අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය යටතේ බඳවා ගන්නා ගුරුවරුන් එම විෂය ක්ෂේත්‍රයේ පමණක් ඉගැන්වීම් සිදුකල යුතුය.

2.2 අයදුම්පත් කැඳවනු ලබන යම් විෂයයක පුරප්පාඩු සංඛ්‍යාවට වඩා එම විෂයය ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව අඩු වුවහොත් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා පත්කරගනු ලැබේ.

2.3 සුදුස්සන් තෝරා ගැනීමේදී රැකියා විරහිත උපාධිධාරීන් තෝරා ගැනීම කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් පුරප්පාඩු තත්ත්වය අනුව උතුරු මැද පළාත තුළ ඕනෑම පාසලක සේවය කිරීමට එකඟ විය යුතුය.

2.4 ලිඛිත විභාගය : විභාග කොමසාරිස් ජනරාල් හෝ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි.<u>අයදුම්පත් එවීමෙන් පසුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.</u>

අ). මෙම ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| I. | අභියෝග්‍යතා පරීක්ෂණය | - | කාලය පැය 01 ( ලකුණු 100) |
| II. | සාමාන්‍ය දැනීම | - | කාලය පැය 01 ( ලකුණු 100) |

ආ). විෂය නිර්දේශය

**විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය**

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොටගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.

**විෂය අංක 02 - සාමාන්‍ය දැනීම**

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන් විත වේ.

2.5 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරික්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාවය පරික්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරික්ෂණයේදී මූලික සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලබන අතර, ලකුණු ලබා දීමක් නොකෙරේ.

2.6 ප්‍රායෝගික පරීක්ෂණය

ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගැන්වීමේ ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම සඳහා පවත්වනු ලැබේ. අයදුම්කරු විසින් හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහ (5) කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණයේදීම ඉදිරිපත් කල යුතු වේ. පරිගණක මාධ්‍යයෙන් (Power Point Presentation) කෙරෙන ඉදිරිපත් කිරීම්වලට ලකුණු ලබා දෙනු නොලැබේ. මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය පහත දක්වා ඇත.

| අනු අංකය | ප්‍රායෝගික පරික්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ටවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

2.7. මෙම තනතුර ස්ථීරය.විශ්‍රාම වැටුප් සහිතය.තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට පත්වීම්ලාභියා යටත් වනු ඇත.

2.8.වැටුප :

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය අංක ජී-ඊ-1-2016 දරන වැටුප් කාණ්ඩය (මාසික රු.27,740-300x6-380x7-445x2-රු.33,090/- ක්) වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවරේ හා ඩිප්ලෝමාධාරීන් 7 වන පියවරේ මාසික වැටුප මත පිහිටුවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමිවේ.

2.9. සුදුසුකම්ලාභීන් රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන, සංශෝධනවලට ද යටත්වනු ඇත.

2.10 ගුරු සේවයේ උසස්වීම් උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

**3 විභාග මධ්‍යස්ථාන - මෙම විභාගය පහත දැක්වෙන නගරවල දී පවත්වනු ලැබේ.**

| නගරය | නගර අංකය |
|---|---|
| අනුරාධපුර | 01 |
| පොළොන්නරුව | 02 |

යම් හෙයකින් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ආසන්නම නගරයේ විභාග මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.

**4 අයදුම් කිරීමේ ක්‍රමය**

4.1. අයදුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව අපේක්ෂකයා විසින් කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. 1සිට 5 තෙක් වන ශීර්ෂය පළමු පිටුවේ ද 6 සිට 8 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරි ශිර්ෂ තෙවන පිටුවට ද වන පරිදි අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය.

4.2. නියමිත සුදුසුකම් සෑම අකාරයකින්ම සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා නියමිත ආකෘතියට අනුකූලව සකස් නොකළ, අසම්පූර්ණ,නියමිත පරිදි විභාග ගාස්තු නොගෙවූ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීම සඳහා ඉඩ දෙනු නොලැබේ. ඒ සම්බන්ධයෙන් පූර්ව දැනුම් දීමක් නොකෙරේ. (ඉදිරිපත් කරන අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු විසින් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

4.3 අයදුම්කරනු ලබන එක් එක් විෂයය සඳහා ඉල්ලුම් කිරීමට තෝරා ගනු ලබන පුරප්පාඩු පවතින තමන් ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප තුනක් (03) කලාප අංක සහිතව අයදුම්කරු විසින් තම කැමැත්තේ අනුපිළිවෙලට අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. (පුරප්පාඩු ලේඛනය සඳහා ඇමුණුම 01 බලන්න)

| කලාපය | කලාප අංකය | කලාපය | කලාප අංකය |
|---|---|---|---|
| අනුරාධපුර | 01 | කැබිතිගොල්ලෑව | 05 |
| කැකිරාව | 02 | පොළොන්නරුව | 06 |
| තඹුත්තේගම | 03 | හිඟුරක්ගොඩ | 07 |
| ගලෙන්බිඳුණුවැව | 04 | දිඹුලාගල | 08 |

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 විධිවිධාන අනුව ඉල්ලුම් කරන විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කෙරෙන අයදුම්පත් වල වම් පස උඩ කෙළවරේ රතුපාටින් තම අබාධිත තත්වය පැහැදිළිව සටහන් කළ යුතුය.

4.5 එක් අපේක්ෂකයකුට එක් විෂයයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පත්‍රයක් පමණි. විෂයය පසුව වෙනස් කළ නොහැක. විෂයයන් කීපයක් සඳහා ඉල්ලුම් කරන්නේනම් එක් එක් විෂයයන් සඳහා වෙන් වෙන්ව වශයෙන් ඉල්ලුම් කළ යුතු අතර විභාග ගාස්තුද වෙන් වෙන්ව ගෙවිය යුතුය.

4.6 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම්පත අනිවාර්යයෙන්ම තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, මෙම පත්වීම සඳහා සුදුස්සකු වශයෙන් තේරී පත්වුවහොත් එම ආයතනයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සහතික කරවා ගත යුතුය.

4.7 විභාග ගාස්තුව රු. 600/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට උතුරු මැද පළාත් සභාවේ අය ශීර්ෂ අංක 20.03.02.13 බැර වන ලෙස ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන එන්සී100 රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය) විභාග ගාස්තු ගෙවීම සඳහා ඉහත නියම කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර පිට පළාත් කාර්යාල හෝ බැංකු හෝ තැපැල් කාර්යාල වලට ගෙවන ලද හෝ නියමිත දිනට පසුව ගෙවන ලද රිසිට්පත් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිළධාරීවරයෙකු, පොලිස් සේවයේ මාණ්ඩලික තනතුරක් දරණ නිළධාරීයෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිළධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

4.9 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2021.08.31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **(උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම- 2021) ලෙස හා ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය, ඉල්ලුම් කරන විෂය හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.**

4.10 තැපැල් මඟින් ඉදිරිපත් කිරීමේදී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව වූ කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

4.11 සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළකරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

මෙම පුවත්පත් නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

තේජානි තිලකරත්න
ලේකම්.
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## උතුරු මැද පළාතේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - 2021(සිංහල/දෙමළ/ද්විභාෂා)

විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය : | | |
**(නිවේදනයේ 03 ඡේදය අනුව සම්පූර්ණ කරන්න)**

| ඉල්ලුම් කරන විෂයය අංකය | ඉල්ලුම් කරන විෂය | කලාප අංකය | | |
|---|---|---|---|---|
| | | | | |

**(ඇමුණුම 01 පුරප්පාඩු ලේඛණය අනුව සහ 4.3 ඡේදය අනුව සම්පූර්ණ කරන්න)**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල-S දෙමළ-T ඉංග්‍රීසි - E
(අදාළ අක්ෂරය කොටුව තුළ යොදන්න)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය

1. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් උදා - PERERA A.B )
...............................................................................................................................
...............................................................................................................................

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )
...............................................................................................................................

1.3 සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළෙන් ) .....................................................................
...............................................................................................................................

2. වර්තමාන ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )
...............................................................................................................................
...............................................................................................................................

2.1 ස්ථිර පදිංචි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය .....................................................................

2.2 ග්‍රාම නිළධාරි කොට්ඨාසය ...............................................................................................

3. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

3.2 උපන් දිනය වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 2021.08.31 දිනට වයස අවුරුදු | | | මාස | | | දින | | |

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය .........................

3.5 විවාහක / අවිවාහක බව ....................................

3.6 දුරකථන අංකය : | | | | | | | | | | |

4. ඔබ දැනට රැකියාවක නියුක්තව සිටීද .........................

4.1 ඉහත පිළිතුර “ඔව්” නම් තනතුර හා ආයතනය : ................................................................
...............................................................................................................................

5. හදාරා ඇති උපාධිය පිළිබඳ විස්තර :

5.1 උපාධි පාඨමාලාවේ නම ...............................................................................

5.2 භාෂා මාධ්‍යය ...............................................................................

5.3 විශ්ව විද්‍යාලයේ හෝ අදාළ ආයතනයේ නම ................................................................

5.4 උපාධිය වලංගු දිනය ...............................................................................

5.5 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් (ඉංග්‍රීසි අකුරින්)
...............................................................................................................................

(ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.විදේශීය හෝ අනුබද්ධිත විශ්වවිද්‍යාල උපාධි සඳහා පමණක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි සහතිකය ඇමිණිය යුතුය.)

6. හදාරා ඇති ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ විස්තර:

6.1 ඩිප්ලෝමා පාඨමාලාවේ නම ..........................................................................

6.2 භාෂා මාධ්‍යය ..........................................................................

6.3 සහතිකය නිකුත් කළ ආයතනය ..........................................................................

6.4 ප්‍රතිඵල වලංගු වන දිනය ..........................................................................

6.5 ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් (ඉංග්‍රිසි අකුරින්)

..........................................................................................................................................

(ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැතිඅයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

7. 7.1 අ.පො.ස. ( උ.පෙළ ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

7.2 විභාග අංකය හා වර්ෂය ..........................................................................

| විෂයයන් | ලබාඇති සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

8. අ.පො.ස. ( සා.පෙ) විභාගය (ප්‍රතිඵල ලේඛනවල තමා විසින්ම සහතික කළ ඡායා පිටපතක් අමුණා ඉදිරිපත් කළ යුතුය. එම ලේඛන එවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

8.1 පළමු වර :

විභාග වර්ෂය .......................................... විභාග අංකය................................

| | විෂයයන් | ලබා ඇති සමාර්ථය | අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

8.2 දෙවන වර :

විභාග වර්ෂය ......................... විභාග අංකය .............................

| අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය | අනු අංකය | විෂයයන් | ලබා ඇති සමාර්ථය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

( වෛකල්පික විෂයයන් ඇතුළත් නොකළ යුතුය )

9. 9.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ............................................................

9.2 ගෙවූ දිනය ..............................................

9.3 කුවිතාන්සි අංකය ....................................

| |
|---|
| විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

10. අයදුම්කරුගේ සහතිකය

10.1 මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සහ/ හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව පිළිගනිමි.

10.2 මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව හෝ නුසුදුසු බව අනාවරණය වූවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව දනිමි

10.3 මෙම නිවේදනයේ සඳහන් කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය ...........................................                    ...................................................

අයදුම්කරුගේ අත්සන

11. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු / අයදුම්කාරිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ................... දින මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි .

දිනය .........................................

නම .........................................                    ........................................

තනතුර .........................................                    සහතික කරන්නාගේ අත්සන

නිලමුද්‍රාව .........................................

12. **රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතුය.**

මෙම ඉල්ලුම්කරු වන ..........................................................................................මයා/මිය/මෙනවිය

මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ............................................................ වශයෙන් සේවය කරනු ලබයි. රාජකාරී කාලය තුළ ඔහු මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර ) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය : ....................................                    .................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව සහිතව)